2126

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2014
Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II |
| කාලය / காலம் / Time: පැය 02 | | |

නම :- ..................................................... විභාග අංකය :- .........................

I කොටස

සැලකිය යුතුයි:
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුරට ලකුණු 02 බැගින් මුළු ලකුණු 40කි.
- පහත සඳහන් ප්‍රශ්නවල ඒ ඒ ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

(01) පුද්ගලයා සසරට බැඳ තබන තණ්හාවේ ප්‍රධාන කොටස් ගණන වන්නේ,
(1) 2කි (2) 3කි (3) 4කි (4) 6කි

(02) බුදු දහමෙ මූලික ඉගැන්වීමක් වන චතුරාර්ය සත්‍ය ධර්මය ඇතුළත් වන සූත්‍ර දේශනා දෙකක් වන්නේ,
(1) මහා මංගල හා පරාභව සූත්‍රයන්ය.
(2) කරණීය මෙත්ත හා මහා මංගල සූත්‍රයන්ය.
(3) දම්සක් පැවතුම් හා සච්ච විභංග සූත්‍රයන්ය.
(4) දම්සක් පැවතුම් හා මංගල සූත්‍රයන්ය.

(03) බුදුරජාණන් වහන්සේගේ අග්‍ර උපස්ථායක තනතුර දැරූ ආනන්ද හිමියන් ඇතුළු ශාක්‍ය කුමාරවරු පිරිස බුදුරදුන්ගෙන් පැවිදි බව ලැබූ ස්ථානය වනුයේ,
(1) අනුපිය අඹ වනය (2) ජේතවනාරාමය
(3) පූර්වාරාමය (4) වේළුවනාරාමය

(04) සසර විය — බේදය
නොගෙන මුනි — අවවාදය
කළේ සඟ — බේදය
වීය නිවනට එම — පමාදය

මෙම පද්‍යයේ සඳහන් පරිදි මුනි අවවාදය නොපිළිගෙන සංඝ භේදය සිදු කළේ කවු ද?
(1) ඡන්න තෙරුන්ය (2) චූල්ල පන්ථක තෙරුන්ය
(3) මහා පන්ථක තෙරුන්ය (4) දෙව්දත් තෙරුන්ය

(05) බුද්ධ කාලීන එක්තරා භික්ෂුවක් රහත් බව ලැබීමත් සමඟම කර්මානුරූපව දෙඇස් අන්ධ වීමද සිදු විය. එම භික්ෂුව වන්නේ,
(1) මුගලන් හිමි (2) චක්ඛුපාල හිමි
(3) පූතිගත්ත තිස්ස හිමි (4) අංගුලිමාල හිමි

(06) මතක වස්ත්‍ර පූජාව හා අනිත්‍ය මෙනෙහි කරන ගාථා සජ්ඣායනය, පැන් වැඩීම යන සිරිත් සියල්ලම සිදු කෙරෙනුයේ,

(1) ඉඳුල් කට ගෑමේදී ය
(2) අකුරු කියවීමේදී ය
(3) විවාහ චාරිත්‍රවලදීය
(4) අවමංගල චාරිත්‍රවලදී ය

(07) නව අරහාදී ගුණ මෙනෙහි කරමින් කරනු ලබන භාවනාව වන්නේ,

(1) බුද්ධානුස්සති භාවනාවයි
(2) ධම්මානුස්සති භාවනාවයි
(3) සංඝානුස්සති භාවනාවයි
(4) චිත්තානුපස්සනා භාවනාවයි

(08) බුදුරජාණන් වහන්සේ විසින් භික්ෂූන් වහන්සේලාට පිරි නැමූ අග තනතුරු කිහිපයක් පහත දැක්වේ.

A - බහුශ්‍රැතයන් අතර අග තනතුර
B - සද්ධිමතුන් අතර අග තනතුර
C - ධෛර්ය සම්පන්නවුන් අතර අග තනතුර
D - අවබෝධ ශක්තිය ඇත්තවුන් අතර අග තනතුර
E - චතුර ධර්ම කථිකයින් අතර අග තනතුර

ඉහත තනතුරු අතරින් ආනන්ද හිමිට ලැබුණු අග තනතුරු ඇතුළත් නිවැරදි පිළිතුර වන්නේ,

(1) A,B හා E ය
(2) C,D හා E ය
(3) B,C හා A ය
(4) A,C හා D ය

(09) "සාරංච සාරතෝ ඤත්වා - අසාරංච අසාරතෝ"
ඉහත සඳහන් ගාථා පාඨයේ සරල අදහස වනුයේ,

(1) නිසරු දේ සරු ලෙසත්, සරු දේ නිසරු ලෙසත් ගැනීමයි
(2) සරු දේ සරු ලෙසත් නිසරු දේ නිසරු ලෙසත් ගැනීමයි
(3) සරු දේත්, නිසරු දේත් නිසරු ලෙස ගැනීමයි
(4) සරුදේත් නිසරු දේත් සරු ලෙස ගැනීමයි

(10) නිසිකළ අධ්‍යාපනය නොලැබ අලසව කල්ගෙවා ධනය උපයා නොගත් පුද්ගලයා ජීවිතයේ අවසාන භාගයේ දී,

(1) සතුටින් කල්ගෙවයි
(2) බොහෝ දෙනාගේ අවමානයට ලක්වේ
(3) නෑදෑයන්ගෙන් ඈත් වේ
(4) පසු තැවෙමින් කල් ගෙවයි.

(11) ඇතැම් මිතුරෝ හදිසි කරදර අවස්ථාවලදී අවශ්‍ය උපකාර නොකර මග හරිමින් පසුව උදව් කරන බව පවසති. මෙවැනි මිත්‍ර ප්‍රතිරූපකයන් සිඟාලෝවාද සූත්‍රයේ හඳුන්වන්නේ,

(1) අඤ්ඤදත්ථුහර
(2) වචීපරම
(3) අනුප්පියභානි
(4) අපාය සහායක

(12) අත්තුපනායික ධර්ම පර්යාය ලෙස දහමෙහි හැඳින්වෙන්නේ,

(1) සියලු සත්වයන්ට නිරන්තරයෙන් මෛත්‍රී කිරීම ය.
(2) සතර බ්‍රහ්ම විහරණ ආරක්ෂා කිරීම ය.
(3) තමා උපමාවට ගෙන අන්‍යන්ට දුක් දීමෙන් වැළකීම ය.
(4) ත්‍රිකෝටික පාරිශුද්ධ ශීලයෙන් යුක්ත වීමයි.

(13) අඹුසැමි දෙදෙනා අන්‍යෝන්‍ය ගෞරවයෙන් යුතුව සතුටින් හා සමාදානයෙන් සාර්ථක පවුල් ජීවිතයක් ගත කිරීමේ දී වඩාත් වැදගත් වන ශික්ෂා පදය වන්නේ,
(1) පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන ශික්ෂා පදයයි.
(2) අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන ශික්ෂා පදයයි.
(3) කාමේසුමිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන ශික්ෂා පදයයි.
(4) මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන ශික්ෂා පදයයි.

(14) අනුන්ගේ දියුණුව සැපත දැක සැබවින්ම ඊර්ෂ්‍යා නොකර ඒ පිළිබඳව අවංකවම සතුටට පත්වීම උතුම් ගුණාංගයකි. එම ගුණාංගය නම්,
(1) මෙත්තා ගුණයයි (2) කරුණා ගුණයයි
(3) මුදිතා ගුණයයි (4) උපේක්ඛා ගුණයයි

(15) මිදුල්වල වැටෙන කුණු රොඩු හැමදාම
ඉදල් වලින් හැකි වන මුත් ඇමදීම
කැලැල් වුනොත් යම් කෙනෙකුගේ පැවතීම
මුදල් වලින් වත් නොහැකියි දුරලීම
මෙම පද්‍යයෙන් ප්‍රධාන වශයෙන් ඔබට ලබාදෙන ආදර්ශය වන්නේ,
(1) පරාර්ථකාමීව ලෝකයේ ජීවත් විය යුතු බව ය.
(2) යහපත් චරිතයකින් ජීවත් විය යුතු බව ය.
(3) පරිසර හිතකාමීව ජීවත් විය යුතු බව ය.
(4) ස්වකීය වගකීම නොව යුතුකම් නිසි ලෙස ඉටු කළ යුතු බව ය.

(16) බුදුරජාණන් වහන්සේ විසින් චුල්ල සෙට්ඨි ජාතකය දේශනා කර ඇත්තේ කවුරුන් මුල් කරගෙන ද?
(1) චුල්ල සෙට්ඨි සිටුතුමාණන් (2) චුල්ලන් තේවාසිකයන්
(3) චුල්ල පන්ථක හිමියන් (4) දෙව්දත් තෙරුන් මුල් කරගෙනය

(17) රජෙකු ඕනෑවට වඩා ඉඳුරන් පිනවමින් කටයුතු කිරීමට ගියහොත් රටත්, ජනතාවත් අමතක වෙයි. රට අවුල් වියවුල් වෙයි. එසේ නොවී කටයුතු කිරීම සඳහා රැකිය යුතු ධර්මය වන්නේ,
(1) අවිහිංසාවයි. (2) තපසයි. (3) ඉවසීමයි. (4) මෘදු බවයි.

(18) "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටින සේක්වා. මේ ආසනය ඔබ වහන්සේ වෙනුවෙන් ම පනවන ලදි. මෙසේ ප්‍රකාශ කළේ,
(1) සකුළුදායි පිරිවැජියා ය. (2) නිග්‍රෝධ පරිබ්‍රාජකයා ය.
(3) පොට්ඨපාද පරිබ්‍රාජකයා ය. (4) උපාලි ගෘහපතියා ය.

(19) පොළොන්නරු යුගයේ "අටදාගෙය" නමින් දළදා මාළිගයක් ඉදිකළ රජතුමා වන්නේ,
(1) නිශ්ශංක මල්ල රජතුමා ය. (2) පළමුවන පරාක්‍රමබාහු රජතුමා ය.
(3) හතරවන පරාක්‍රමබාහු රජතුමා ය. (4) පළමුවන විජයබාහු රජතුමා ය.

(20) දස අකැප වස්තුවෙහි සඳහන් වන 'කප්පති ජලෝගි පාතුං' යන්නෙහි තේරුම වන්නේ,
(1) පැසීගෙන එන සුරාව පානය කිරීම කැපය යන්නයි.
(2) අඟක ලුණු තබාගෙන අනුභව කිරීම කැපය යන්නයි.
(3) ගමකින් ගමකට යාමේ දී වළදා ඉතිරි ආහාර රැගෙන යාම කැපය යන්නයි.
(4) ඉර හැරී අඟල් දෙකක් සෙවනැල්ල වැටෙන තුරු දානය වැළඳීම කැපය යන්නයි.

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20කි. අනෙක් ප්‍රශ්න වලට 10 බැගිනි.

(01) ඔබ පන්තියේ බුද්ධ ධර්ම විෂයට අදාළව තුන්වන වාරයෙහි පැවති ඇගයීම වූයේ නායකත්ව ලක්ෂණ උපයෝගි කරගෙන යහපත් ආර්ථිකයක් ගොඩ නැංවීමේ කරුණු තහවුරු කරන රාජධම් පිළිබඳ සංවාදශීලි ළමා පාර්ලිමේන්තුවකි. ඒට අදාළව පහත ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

(1) පාර්ලිමේන්තු ප්‍රධානියා කුමන නාමයකින් හැඳින්වේ ද? (ලකුණු 02)

(2) පාර්ලිමේන්තුවක සිදුකරන ප්‍රධාන කාර්යයන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(3) ළමා පාර්ලිමේන්තුවට අදාළව ඔබට ලැබුණු ගුරු උපදෙස් දෙකක් ලියන්න. (ලකුණු 02)

(4) ඔබ, ළමා පාර්ලිමේන්තුව තුළින් ලබාගත් අත්දැකීම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(5) "රජ" යන්නෙහි තේරුම කුමක් ද? (ලකුණු 02)

(6) අතීතයේ ධාර්මිකව රට පාලනය කරමින් රට ස්වයං පෝෂණය කළ රජවරුන් දෙදෙනෙකුගේ නම් ලියන්න. (ලකුණු 02)

(7) දසරාජ ධම්වලින් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(8) රොන් අරගෙන සෙමින්
යන බිඟු ලෙසින් කුසුමින්
ලොවට දුක් නොදෙමින්
ගනිති අය පඩුරු පෙර තියමින්
මෙහි 'අය පඩුරු' යනු කුමක් ද? (ලකුණු 02)

(9) උත්සාහය තිබේ නම් මී කුණක් වැනි දෙයක් වුවද විකුණා දියුණු විය හැකි බව සඳහන් වන ජාතක කථාව කුමක් ද? (ලකුණු 02)

(10) ළමා පාර්ලිමේන්තුවේදී ඔබ මුහුණ දුන් අභියෝග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(02) (1) චතුරාර්ය සත්‍යය අනුපිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)

(2) එහි පළමු ආර්ය සත්‍යයට ඇතුළත් වන කරුණු හයක් නම් කරන්න. (ලකුණු 03)

(3) එම කරුණු අතරින් තුනක් පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 05)

(03) (1) සංඝ රත්නයේ ගුණ කීය ද? (ලකුණු 02)

(2) එම ගුණ අතරින් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(3) විහාරස්ථානයෙන් ඉටුවන සේවාවන් කවරේදැයි ලියන්න. (ලකුණු 05)

(04) (1) සිරිත් හා විරිත් යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

(2) බුද්ධානුස්සති භාවනාව වැඩීමෙන් ලැබෙන අනුසස් තුනක් ලියන්න. (ලකුණු 03)

(3) ආනන්ද හිමිගේ චරිතයෙන් අපට ගත හැකි ආදර්ශ පෙන්වා දෙන්න. (ලකුණු 05)

(05) (1) පහත සඳහන් ධම්ම පද ගාථාවේ ඉතිරි දෙපදය සම්පූර්ණ කරන්න.
අසාරෙ සාර මතිනො - සාරෙ චා සාර දස්සිනො
.................................................................. (ලකුණු 02)

(2) සේඛියා දහමේ ඇඳුම් භාවිතය පිළිබඳ සිරිත් ඉගැන්වීමේදී සුපටිච්ඡන්න වීම යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? (ලකුණු 03)